# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1760/4 - 2012 මැයි මස 28 වැනි සඳුදා - 2012.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනත

2012 අංක 4 දරන පනතින් සංශෝධනය කරන ලද පරිදි වූ 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනතේ 8 වන වගන්තිය යටතේ බදු අභියාචන කොමිෂන් සභාව මගින් සාදනු ලබන රීති.

විනිසුරු හෙක්ටර් එස්. යාපා,
සභාපති,
බදු අභියාචන කොමිෂන් සභාව.

2012 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

*රීති*

1. මේ රීති, 2012 බදු අභියාචන රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

**අභියාචන පටිපාටිය**

2. (අ) පනත යටතේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, පෙත්සමක ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ආ) අභියාචනා පෙත්සමක පහත දැක්වෙන විස්තර ඇතුලත් විය යුතුය :–

(i) අභියාචනාකරුගේ නම සහ ලිපිනය ;
(ii) බදු ලිපිගොනු අංකය / බදු ගෙවන්නාගේ හඳුනා ගැනීමේ අංකය ;
(iii) කොමසාරිස් ජනරාල්වරයාගේ නිශ්චය කිරීමේ අංකය හා දිනය ;
(iv) අදාළ බද්දේ ස්වභාවය හෝ වර්ගය ;
(v) තක්සේරු අංකය / අය අංකය සහ දිනය ;
(vi) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබූ පරිදි මුළු බදු / අය සහ පනවනු ලැබූ දණ්ඩනය ;
(vii) අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් පදනමක් හෝ හේතුවක් මතද, එකී පදනම හෝ හේතුව පිළිබඳ සරළ හා සංක්ෂිප්ත ප්‍රකාශයක්. එකී ප්‍රකාශය විධිමත් ලෙස අංක යෙදූ ඡේද වලින් දක්වා තිබිය යුතුය ;
(viii) ඉල්ලා සිටිනු ලබන සහනය ; සහ
(ix) අවසර ලත් නියෝජිතයෙකු සිටී නම්, ඔහුගේ නම සහ ලිපිනය.

3. පෙත්සම්කරු විසින්, පෙත්සම සමග, පනතේ 7 වන වගන්තිය මගින් අවශ්‍ය කරනු ලබන පරිදි අභියාචනාකරු විසින් ගෙවිය යුතු වූ මුදල් ප්‍රමාණය ලෙස කොමසාරිස් ජෙනරාල් විසින් තක්සේරු කරනු ලැබූ මුදලින් සියයට විසිපහකට සමානවූ මුදල් ප්‍රමාණයක් ගෙවූ බවට ලේඛන සාධක ඉදිරිපත් කළ යුතුය.

4. ආපසු නොගෙවනු ලබන රුපියල් දෙදහස් පන්සියයක ගාස්තුවක්, කොටුවේ පිහිටි ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ පවත්වාගෙන යන අංක 7040110 දරන කොමිෂන් සභාවේ ගිනුමට ගෙවිය යුතු අතර, එකී බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ලදුපත පෙත්සමට අමුණා ඉදිරිපත් කළ යුතුය.

5. පෙත්සම්කරු විසින් පෙත්සමේ සහ එයට අමුණා ඇති සියළුම ලේඛනවල පිටපත් හයක් (6) සකස් කරනු ලැබිය යුතු අතර, එම ලේඛන කොමිෂන් සභාවට එහි කාර්යාලයෙහිදී ඉදිරිපත් කළ යුතුය.

6. පෙත්සම සමග ඉදිරිපත්කරනු ලබන සියළු ලේඛන, මුල් ලේඛනයේ සහතික කළ පිටපත් විය යුතුය.

*අභියාචනා විභාග කිරීම සහ නිශ්චය කිරීම*

7. යම් පෙත්සම්කරුවකු විසින් ඉදිරිපත් කරනු ලබූ පෙත්සම විභාග කිරීම සඳහා නියම කර ගනු ලැබූ දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳව එම පෙත්සම්කරුහට දැනුම් දිය යුතුය.

8. (1) කොමිෂන් සභාව විසින් විභාගයට ගනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන් කවර සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි අවශ්‍ය වන්නේද, එකී සාක්ෂිකරු අභියාචනය විභාග කිරීමට නියමිත දිනය, වේලාව සහ ස්ථානය නිශ්චිතව සඳහන් වූ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්, අභියාචනා විභාගය සඳහා කැඳවනු ලැබිය යුතුය.

(2) යම් විභාගයක දී සාක්ෂි දීම සඳහා කොමිෂන් සභාව විසින් කැඳවනු ලැබූ යම් සාක්ෂිකරුවෙකුට එකී සාක්ෂිකරුගෙන් අවශ්‍ය කරනු ලබන කරුණු පිළිබඳව දැනුම් දිය යුතු අතර, එකී අවශ්‍ය කරුණු සමග අභියාචන විභාගයට පැමිණීම එකී සාක්ෂිකරුගේ කාර්යය වන්නේය.

9. (1) ඒ සඳහා නියම කරනු ලැබූ දිනයේදී යම් අභියාචනයක් විභාගකර නිම කිරීමට නොහැකිවන අවස්ථාවකදී, කොමිෂන් සභාවට එකී විභාගය පාර්ශවකරුවන්ට පහසු දිනයකට කල් තැබිය හැකිය.

(2) අවස්ථාවෝචිත පරිදි, විභාගය සඳහා නියම කරගනු ලැබූ දිනයේදී හෝ කල්තබන ලද දිනයකදී නොවැළැක්විය හැකි හේතුවක් නිසාවෙන් විභාගයට පැමිණීමට අභියාචනාකරුට නොහැකි වන අවස්ථාවකදී, එම නොහැකියාව පිළිබඳව අභියාචනාකරු විසින්ම හෝ තම අවසර ලත් නියෝජිතයා මගින් හෝ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින් අභියාචනය විභාග කිරීම සඳහා වෙනත් දිනයක් සහ වේලාවක් ලබා දෙනු ලැබිය හැකිය.

10. විභාගය සඳහා ලැයිස්තුගත කරනු ලැබූ එහෙත් යම් හේතුවක් නිසාවෙන් විභාගයට ගැනීමට නොහැකි වන යම් අභියාචනයක් නැවත ලැයිස්තුගත කළ යුතු අතර, විභාගය සඳහා නියම කරනු ලැබූ එකී අළුත් දිනය සහ වේලාව පිළිබඳව පාර්ශවකරුවන්ට දැනුම් දිය යුතුය.

11. (1) අභියාචනා විභාගයේ දිනය සහ වේලාව පිළිබඳව දැනුම්දීමක් ලැබුනු අභියාචනාකරුවකු, ඒ සඳහා තම නොහැකියාව පිළිබඳව කොමිෂන් සභාවට දැනුම්දීමක් නොකොට විභාගයට පැමිණීමට අපොහොසත් වන අවස්ථාවක, අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතුය.

(2) (1) වන ඡේදයේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද, නිෂ්ප්‍රභ කරන ලද අභියාචනයක්, අභියාචනාකරුගේ නොපැමිණීම සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි සාධක කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු, කොමිෂන් සභාව විසින් යළි ලැයිස්තුගතු කිරීමට ඉඩදෙනු ලැබිය හැකිය.

12. (1) අභියාචන විභාගයේදී අභියාචනකරු හෝ ඔහුගේ අවසර ලත් නියෝජිතයා හෝ විසින් අභියාචනයට පාදකවූ හේතු පැහැදිලි කරමින් කෙටි වාචික දේශනයක් කරනු ලැබිය හැකිය.

(2) කොමිෂන් සභාව විසින් අවශ්‍ය අවස්ථාවලදී, ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස පාර්ශවකරුවන්ට දැනුම් දෙනු ලැබිය හැකිය.

13. කොමිෂන් සභාවේ නිශ්චය කිරීම පිළිබඳව කොමසාරිස් ජෙනරාල්වරයාට සහ අභියාචනාකරුට කොමිෂන් සභාව විසින් ලිඛිතව දැනුම් දිය යුතු අතර, එහි පිටපතක් ලැබීමට ඔවුන්ට හිමිකම ඇත්තේය.

14. කොමිෂන් සභාවේ ලේකම් විසින් අභියාචන විභාගයට අදාළව ජර්නල් සටහන් පවත්වාගෙන යා යුතුය.

15. මේ රීති වල කාර්යය සඳහා

"පනත" යන්නෙන්, 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනත අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන්, 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද බදු අභියාචන කොමිෂන් සභාව අදහස් වේ ; සහ

"කොමසාරිස් ජෙනරාල්වරයා" යන්නෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා අදහස් වේ.

06-486

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.